

# අහස හැඬුවේ ය

විනිතා තලේරත්නගේ
නිර්මාණයක්

**උදෑසන** වහලයට දිය බිඳු වැටෙන හඬින් අවදි වු මම කවුලුව වෙත ඇදී අහස දෙස බලා සිටින්නට විමි. අලු පැහැය මුලු අහස පුරා එකසේ විසිරී තිබින වෙනදා උදා ගිරෙන් මතුවෙන හිරු කුමරු අහස් කුමරියට හැකි තරම් හඬන්නට ඉඩ දෙමින් වළාකුළකට මුවා වි නිදා සිටියේ ය. නෙත ගැටෙන මානයේ වු රෝස පඳුරේ මල් කැකුළිය දියබත් වි ලැජ්ජාවෙන් මෙන් හැකිළී සිටිනු මට පෙනින. සියල්ල ප්‍රබෝධමත්ය මම සෙනෙහසින් යුතුව අහස දෙස බලා සිටින්නට විමි.

වැස්ස....

' මොකද මං දිහා ඔය විදියට බලා ඉන්නෙ...? ' හදිසියේ හඬක් නැගින.

මම වට පිට බැලිමි. කිසිවෙකු නැත කතා කරන්නේ කවරෙක්ද..?

කුතුහලයෙන් යුතුව අහස දෙසට බැල්මක් හෙලිමි. අහස කතා කරයි මම සන්සුන් වන්නට වැයම් කළෙමි.

' ඇයි මේ තරම් අඬන්නෙ...? විනාඩියකට පමණ පසු විර්යය උපදවා ගත් මම පැනයක් නැගුවෙමි.

'මං අඬන්නෙ නෑ.. මිනිස්සුන්ට පීවය සහ සතුට බෙදනව..'

'සතුට...'

'ඔවු.. ඔයගොල්ලන්ට පුලුවනිද මගෙ කඳුළු නැතිව පිවත් වෙන්න..?'

මම සිතන්නට විමි..

'ඇත්ත නේන්නම්.. බෑ.. බෑ..' මම හඬක් නොනගා සිනාසෙමින් කිමි.

මොහොතකින් එක්වරම දිය බිඳු රාශියක් එක පිට එක ඇද හැලෙන්නට විය.

' ඒ ගමන ඇයි..?

'මගෙ හිතේ දුකක් තියෙනව..'

'දුකක්...?" මම පුදුම විමි.

'ඔවු.... මොන තරම් හොඳ කළත් මිනිස්සුන්ගෙන් හොඳක් අහන්න පුලුවනිද...?හැම විටම දකින්නේ දොස් පමණයි... අහස කීවේ කණගාටුවෙනි... එය සත්‍යයකි.

'ගණන් ගන්න එපා.. හැම මිනිහම එහෙම නෑ... අනික මිනිස්සු හරියට අතේ ඇඟිලි පහ වගේ කියලයි මගෙ අම්ම මට උගන්වල තියෙන්නෙ.. ' මම අහස අස්වසන්නට වෑයම් කරමින් කිමි.

මොහොතක නිහැඬියාවකි මම අලු පැහැති අහස දෙස බලා සිටින්නට විමි.

'යමක් ලියන්න බැරිද මේ ගැන...? අහස මගෙන් ඇසුවේ සැකයෙනි.

ලියන්න...? මම සිතන්නට විමි.

'ලියන්න බැරි නෑ..ඩ ඒත් පිලිගනිද නැද්ද කියන එක තමයි ප්‍රශ්නෙ..'

'ඒකට කමක් නෑ.. උත්සාහ කරන්ට.. අඩු තරමින් කීප දෙනෙක් හරි තේරුම් ගනීවිනෙ.

'හොඳයි මං බලන්නම්... මම කිමි මා වෙත ස්තුති පූර්වකව සිනාවක් පාන්නාක් මෙන් අහස පුරා රිදි රේඛාවක් ඇඳී ගියේ ය. මම මොහොතක් අහස දෙස බලා සිටියෙමි.

'අහස පොළව ඉර හඳ අපි
එක පවුලක් සේ සිතන්න '

කවි පදයක් මගේ සිතට ගලා ආවේය. පොරොන්දු වු ප්‍රකාර මම ලියා තබමි.

මිනිසුනි කෙනෙකු තුල ඇති හොඳ දේ පමණක් දකින්නට පුරුදු වන්න ■

## සොහොයුරෙකුගේ හදින්

**නොවැම්බර්** මස සන්නස කලාපයේ පලවු 'සොහොයුරියකගේ හදින්' නම් ලිපිය කියවූ පසු මා සිත තුළ සියුම් සතුටක් ඇති වුණා සේ මට හැඟුණි. මන්දයත් සොහොයුරියකගේ සිත තුළ මෙවන් අදහසක් පහලවීම පිළිබඳවය. ගොඩක් මෙම රටට සංක්‍රමනය වන සොහොයුරියන් (සැමට නොව) ආව මුල් මාස කිහිපය තුළ නැවත ආපසු යන්නට තිබේ නම් කියන මතයේම ඉඳගෙන නඟන අදෝනාවන් බොහොමය. ඒත් ඉතින් කාලයාගේ ඇවෑමෙන් සුක්කානම් වීලය අතට හුරුවී අව් කණ්ණාඩිය ඉඳලා පහසුකම් සහිත නිවසක් තුළ සිටින විට අර පෙර නගපු සියළු දෙය අමතක වූ අය ලෙස හැසිරෙන බැවිනි.

ඉතින් ලිපියට අනුව අප විසින් පරාජය කළ යුතුව ඇත්තේ මේ බොරුව හා මායාවට වඩා ඊට ඇති ඉල්ලුමයි. මමත් ලංකාවට ගිය විටෙක ඔය කියන ඉල්ලුම පරාජය කිරීමට ගොස් අදටත් මගේ ලංකාවේ වසන යාලුවන් කිපදෙනෙකු මා හට පෙර තිබූ ඉල්ලුමට වඩා අඩු ඉල්ලුමක් ඇති වූවා සේ මට දැනේ. සියළු දෙයින් මෙහි ඇති සත්‍යය පැහැදිලි කිරීමට ගොස් මම එහෙම කියන්නේ මට අයත් ඒවී කියන කුහකකම මා තුළ ඇති බවට යන මතය එම අය තුල ඇතිවී ඇති බැවිනි.

මා වුවත් මෙම රටට මුලින්ම පැමිණීමට පෙර මෙහි සිටින මාගේ හිතවතකුගෙන් මෙරට තත්ත්වය ගැන විමසුවෙමි. ''වැසිකිලියට පමණයි කාර් එකේ නොයන්නේ'' මට ප්‍රතිඋත්තරයක් ලැබුනෙමි. පස්වනත් ප්‍රීතියෙන් මාද මෙරටට පය තැබුවෙමි. මෙරටට පැමිණි පසු හිතවතාගෙන් මේ ගැන විමසුවෙමි. මේ හැම .. වැසිකිලි තිබෙන්නේ ඇතුලේ නිසා කාර් එකේ යන්න බෑනේ යනුවෙන් උත්තර ලැබුනේය. අනික නියම තත්ත්වය කිවා නම් උඹෙයි මගෙයි යාළුකමත් නැතිවන්න පුළුවන්. චවුලාගේ මඟුල් ගෙදර ගියා නම් එල්ලිලා ඉන්න ඔනේ. උඹත් දැන් අපි වගේම එල්ලිලා ඉන්න පුරුදු වෙයන් යනුවෙන් ඔහු පවසන ලදී. දහතුන් අවුරුද්දක් තිස්සේ තවමත් මේ මඟුල් ගෙදර එල්ලී සිටිමි. ඉතින් මාගේ යාලුවා පැවසූ දෙයහි කිසියම් සාධාරණයක් ඇතැයි මට හිතේ.

තවත් මගේ යාලුවෙකු ලංකාවට යන සෑමවිටම වාගේ කුලියට නවීන වාහනයක් ගෙන ගමන් බිමන් යාම කරනු ලැබේ. (මෙහි සිටින අය මහත් ණය මුදල් පවා අරගෙන) මා මට හිතවත් ලෙස මහජන ප්‍රවාහන සේවය යොදා ගන්නෙමි. එසේ මා ලංකාවට ගිය විටෙක මගේ අම්මා කීවා බලන්නකෝ අර පුතා සල්ලි වලට වාහනයකුත් අරගෙන (කුලියට ගත් බව නොකියන බැවින්) ඉන්නේ මොකද පුතා ගන්නේ නැත්තේ කියලා. යාලුවාගේ තත්ත්වය බේරා ගන්නත් ඕනේ යාලුකම රැකගන්නත් ඕන නිසා අපේ ළමයින්ට එහේ කාර්වලම ගමන් බිමන් ගිහින් ඇතිවෙලා තියෙන්නේ වෙනසකටත් එක්ක මම මෙහේම යනවා කියලා කීවා. මෙහේට ආවට පස්සේ මම යාලුවට මේ විස්තර කීවා. පැහැදිලි පිළිතුරක් ලැබුණු නිසා මට උත්තරයකුත් නැතිවිය. යාලුවගේ පිළිතුර වූයේ මචං ඕනම දෙමව්පියෙක් කැමතියි තමන්ගේ දරුවන් කොහේ හෝ හොඳ ජිවිතයක් ගත කරන එක දකින්න. ඒ අයගේ සිත සංතෝෂයෙන් තියෙන එකයි අපි කරන්න ඕනේ. මෙහේට ඇවිත් හොම්බෙන් ගියත් මම ඒ ටික කරනවා යනුවෙනි. අනික අපි යන්නේ කෙටි කාලයකට මෙහෙ අවුරුදු ගණන් මහන්සි වෙලා. ඒ ගත කරන ටික කාලය හරි හොඳට ඉන්න ඕනේ යනුවෙනි. ඔහුගේ පිළිතුරෙහි කිසියම් සාධාරණයක් නැත්තේ ද නොවේ.

ඒ වගේම මා ලංකාවට ගිය විටෙක යාළුවෙකුගේ අම්මා කෙනෙකු පාර්සලයක් දීමට පැමිණ සිටියේය. එම අම්මා ගොඩක් සතුටකින් හා ආඩම්බරයෙන් පැවසුවා. . වුණා. ලංකාවේ මුදලින් කෝටි 2 1/2 ක විතර මාළිගාවක් වගේ සියළු පහසුකම් තියන ගෙයක් අරගෙන ඉන්නේ කියලා. සමහර විට බැංකු ණයක් ගෙන අරගත් බව කීවා නම් අර සතුට එම අම්මාගෙන් නැතිවී යාමටද ඉඩ තිබිණි.



තිලියත් සහ සිවුර පොරවා ගෙන එනසමි
රශ්මීන් විරාජිත පුජිත මහන දම
අවමන් කරන්නේ ඇයි හොඳැහැද දහම
මිනිසුන් මුදුන් විකුනන්නේ ඇයි මෙලෙසම

නිර්මලී දිලිපා විකුමනායක
ශ්‍රොලන්අයිරිස්,
වික්ටෝරියා.

## ස්තුතියි

පසුගිය දිනවල මුහුණ දුන් කුඩා අනතුරක් හේතුවෙන් ඕස්ට්‍රේලියාවට ආ දින සිට ගතකළ කාර්ය බහුල ජීවිතයට මඳකට සමු දෙන්න මට සිදුවුණා. නෑසියන්ගෙන් දුරස්ව ආගන්තුක රටක පය ගසා නැගිටින්න යත්න දරන මොහොතකදී මෙවන් අත්දැකීමක් කටුක වැඩියි කියලයි මට හිතුනෙ. එක තැනක ජීවිතයකට හුරුවන් නොමැති මට එවැනි ජීවිතයකට හුරු වීමත් අලුත් අත්දැකීමක් වුණා. ඒ වගේම මෙල්බන් වල වෙසෙන අපේ ඇතන්ගෙ මනුස්ස කමත් සහෝදරත්වයත් තේරුම් ගන්න අවස්ථාවක් ලැබීම ඊටත් වඩා වැදගත් අත්දැකීමක් කියලයි මට හිතෙන්නෙ. මගේ සේවා ස්ථායේ සියලු ශ්‍රී ලාංකික සොයුරන් මෙන්ම මගේ සමීප හිතවතුන් හා හිතවතියන් මගේ සමීපයේ සිටිමින් මට බලා දුන් දිරියත් මට කළ උපකාරත් කෙදිනකවත් මගේ මතකයෙන් බැහැර නොවන තරම් ප්‍රබලයි. දයාබර මිතුරනේ. සතුටේ දී මා හා හිනැහුණ ඔබ දුකේ දී ද මා තනි නොකළ බව මගේ හදවගේ ගැඹුරුම තැන සනිටුහන් කරගත් බව දන්වන්නට කැමතියි.

ඒ එක්කම වෝබටන් පන්සලේදී වටිනා ලියවිලි සමග නැතිවූ මගේ මුදල් පසුම්බිය අයිතිකරු සොයා ආපසු මට බාරදෙන්නට වෙහෙසුණ නරේවරන්හි නෙලුම් කුමාරපතිරණ සොයුරාටත් තුති මල් මිටක්.

ඔබ සැමට සතුටෙන් පිරි නව වසරක්..

**ශ්‍රීනාත් මද්දුමගේ**